# හාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
# திறைசேரி செயற்பாடுகள் திணைக்களம்
# Department of Treasury Operations

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,මහලේකම් කාර්යාලය, තැ.පෙ.1559, කොළඹ 01, ශ්‍රී ලංකාව.
நிதி திட்டமிடல் அமைச்சு, செயலகம், தபெ. 1559, கொழும்பு 01, இலங்கை
Ministry of Finance & Planning, The Secretariat, P.O.Box: 1559, Colombo 01. Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம்; / Director General | 0094112484729<br>dgto@tod.treasury.gov.lk | ෆැක්ස් / பெக்ஸ் / Fax | 0094 112 484970 | පොදු / பொது / General | 0094 112 484500<br>0094 112 484600 |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | TOD/CFM/Bank AC/2015 | ඔබේ අංකය / உமது இல / Your No. | | දිනය / திகதி / Date | 2015.10. 23 |

හාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක. 03/2015

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත.

**නිල බැංකු ගිණුම් විවෘත කිරීම, අක්‍රිය නිල බැංකු ගිණුම් වසා දැමීම සහ එම බැංකු ගිණුම් වලට අදාල අනිකුත් වෙනස්කම් සිදුකිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය.**

නිල බැංකු ගිණුම් විවෘත කිරීම පිළිබඳව මු.රෙ.380 හා 381 යටතේ දක්වා ඇති විධිවිධාන කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

02. භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය (Treasury Single Account System) යටතේ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු මගින් පවත්වාගෙන යනු ලබන නිල උප බැංකු ගිණුම් සම්බන්ධව භාණ්ඩාගාර පාලනය වඩාත් විධිමත් කිරීම අරමුණු කරගෙන මෙතෙක් එම ගිණුම් සම්බන්ධව භාණ්ඩාගාර අනුමැතිය ලබාගත යුතු අවස්ථා වලදී භාවිතා කිරීමට නියම කර තිබූ ආකෘති පත්‍ර මෙම චක්‍රලේඛය මගින් සංශෝධනය කර අලුතින් හඳුන්වා දී ඇති අතර පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් ඊට අදාල සංශෝධිත ආකෘති පත්‍ර භාවිතා කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

| කාරණය | ආකෘති පත්‍ර අංකය |
|---|---|
| 1. නව නිල බැංකු ගිණුමක් විවෘත කිරීම | TOD/BA/01 |
| 2. නිල බැංකු ගිණුම මෙහෙයවන අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වෙනස් වීම් | TOD/BA/02 |
| 3. අක්‍රීය නිල බැංකු ගිණුම් වැසීම | TOD/BA/03 |
| 4. නිල බැංකු ගිණුම් නාමය වෙනස් කිරීම | TOD/BA/04 |
| 5. නිල බැංකු ගිණුම් පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාව වෙනස් කිරීම (එකම බැංකු පද්ධතියේ ශාඛා අතර) | TOD/BA/05 |

03. මෙම කරුණ සම්බන්ධව අංක 105/98 යටතේ 1998.05.14 දිනැතිව නිකුත් කර ඇති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ ලිපිය මෙයින් අවලංගු කරනු ලැබේ.

04. මේ පිළිබඳ වැඩිදුර විස්තර ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් 0112484994 දුරකථන අංකයෙන් අධ්‍යක්ෂ(ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ) විමසන්නේ නම් මැනවි.

05. මෙම චක්‍රලේඛයේ මෘදු පිටපත(Soft Copy) www.treasury.gov.lk/general-treasury2/treasury-operations භාවිතයෙන් භාණ්ඩාගාර වෙබ් අඩවියට පිවිසීමෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තු පිටුව යටතේ බාගත කර ගත හැක.

එම්.එස්.ඩී.රණසිරි
භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත: විගණකාධිපති

ආකෘති පත්‍ර අංක - **TOD/BA/01**

## <u>නිල බැංකු ගිණුමක් විවෘත කිරීමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා වූ</u>

## <u>අයදුම් පත්‍රය</u>

| | |
|---|---|
| (1) | වැය ශීර්ෂය - |
| (2) | i. අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව -<br>ii. උප කාර්යාලය - |
| (3) | දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය - |
| (4) | බැංකු ගිණුම විවෘත කිරීමේ අවශ්‍යතාවය - |
| (5) | බැංකු ගිණුමේ නම - (අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තනතුර සහ බැංකු ගිණුමේ කාර්යය සංක්ෂිප්තව ඇතුළත් විය යුතුය. උදා:ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය-දේශීය ඖෂධ පැලෑටි සංවර්ධන ව්‍යාපෘතිය) |
| (6) | දැනටමත් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව යටතේ පවතින නිල බැංකු ගිණුම් සම්බන්ධව පහත සඳහන් විස්තර ඉදිරිපත් කරන්න<br><br><u>බැංකු ගිණුමේ නම</u> \| <u>බැංකුව</u> \| <u>බැංකු ශාඛාව</u> \| <u>බැංකු ගිණුම් අංකය</u> \| <u>ක්‍රියාකාරී/ අක්‍රියද යනවග</u> \| <u>අක්‍රිය නිල බැංකු ගිණුම් වැසීමට ගෙන ඇති පියවර</u><br><br>(සපයා ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් වෙනම ලැයිස්තුවක් මෙයට අමුණා එවන්න) |
| (7) | දැනට ක්‍රියාත්මක වන බැංකු ගිණුමක් මෙම කාර්යය සඳහා යොදාගත නොහැකි මන් ද ?<br>එයට හේතු දක්වන්න. |
| (8) | බැංකු ගිණුම විවෘත කිරීමට අදහස් කරන්නේ දැනට ක්‍රියාත්මක වන බැංකු ගිණුමක් වැසීමට කටයුතු කිරීමෙන් නම් එම බැංකු ගිණුම පිළිබඳ විස්තර<br><br>i. බැංකුව \| බැංකු ශාඛාව \| බැ.ගි.අංකය \| ගිණුමේ නම \| .......... දිනට ශේෂය (රු.)<br>________ \| ________ \| ________ \| ________ \| ________ |

| | |
|---|---|
| | ii. අවසාන වරට බැංකු සැසඳීම සකස් කරන ලද්දේ කුමන මසකට අදාලවද ?<br>iii. මුදල් නොවූ චෙක්පත් වල වටිනාකම –<br>iv. දැනට පවතින බැංකු ගිණුම වැසීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ගය කවරේ ද ? |
| (9) | i. විවෘත කිරීමට යෝජිත බැංකු ගිණුම සඳහා මුදල් ලැබෙන්නේ ඒකාබද්ධ අරමුදලින්ද ? විදේශාධාර මුදල් වලින් ද?<br>ii. විදේශාධාර මුදලින් නම් ඇස්තමේන්තු ගත ප්‍රතිපාදන පිළිබඳ විස්තර –<br><br>වර්ෂය - වැය විස්තරය - ඇස්තමේන්තු මුදල (රු.) - |
| (10) | ගිණුම විවෘත කිරීමට අදහස් කරන බැංකුව හා බැංකු ශාඛාවේ නම - |
| (11) | බැංකු ගිණුම මෙහෙයවීමට යෝජනා කරන නිලධාරීන් පිළිබඳ විස්තර –<br>(මෙහි සඳහන් සියළුම විස්තර සැපයීම <u>අත්‍යාවශ්‍ය බව</u> කාරුණිකව සලකන්න)<br><u>**නිලධාරියාගේ නම**</u> <u>**තනතුර**</u> <u>**වාර්ෂික වැටුප**</u> **මු.රෙ.880 යටතේ ඇප තබා තිබේද යන වග**<br>i.<br>ii.<br>iii.<br>iv.<br>v.<br>vi.<br>vii. |
| (12) | යෝජිත නිල බැංකු ගිණුම විවෘත කිරීම සම්බන්ධව තවදුරටත් විස්තර ලබා ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා සම්බන්ධ කර ගත යුතු ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ ගණකාධිකාරී හෝ අදාල වෙනත් නිලධාරියෙකුට අදාලව පහත විස්තර සඳහන් කරන්න.<br>i. නම –<br>ii. තනතුර –<br>iii. දුරකථන අංකය – |
| (13) | ලේකම්,<br>............................................<br>ඉහත සඳහන් විස්තර නිවැරදිය. නව බැංකු ගිණුම විවෘත කිරීමට අදාල ලියකියවිලි මේ සමග ඉදිරිපත් කරමි. ඒවා ඔබගේ නිර්දේශය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන්නේ නම් මැනවි.<br><br>..........................................................................<br>දෙපාර්තමේන්තු ප්‍රධානී/ ප්‍රධාන මූල්‍ය නිලධාරී/<br>ප්‍රධාන ගණකාධිකාරී ගේ අත්සන (නිල මුද්‍රාව) |

(14) භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්,

ඉහත විස්තර සඳහන් බැංකු ගිණුම විවෘත කිරීම නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

දිනය - ...........................................................................

අමාත්‍යාංශයේ ලේකම් (ප්‍රධාන ගණන් දීමේ නිලධාරී)

අත්සන (නිල මුද්‍රාව)

(15) පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.

(i) ගිණුම විවෘත කිරීමේ අවශ්‍යතාවය තහවුරු කිරීමට අදාල ලියවිලි වල පිටපත්

(ii) අදාල බැංකුවෙන් ලබාගත් නිවැරදිව සම්පූර්ණ කරන ලද මැන්ඩේට් පත්‍රය (මෙය යෝජිත බැංකු ගිණුම විවෘත කරන අමාත්‍යාංශයේ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර අදාල නිල මුද්‍රාව තැබිය යුතුයි.)

(iii) ගිණුම මෙහෙයවීමට යෝජනා කරන නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් ඇතුලත් අත්සන් කාඩ්පත්

- එක් අයකු සඳහා අත්සන් කාඩ්පත් 02 බැගින් ඉදිරිපත් කළ යුතු වේ.
- මෙම ආදර්ශ අත්සන් පහත දැක්වෙන පරිදි සහතික කළ යුතුය.

| | |
|---|---|
| (අ ) අමාත්‍යාංශයේ ලේකම්ගේ ආදර්ශ අත්සන | - අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරී / ප්‍රධාන ගණකාධිකාරී විසින් පෞද්ගලිකවම සහතික කොට නිල මුද්‍රාව තැබිය යුතුය. |
| (ආ) දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ආදර්ශ අත්සන | - අමාත්‍යාංශ ලේකම් විසින් පෞද්ගලිකවම සහතික කොට නිල මුද්‍රාව තැබිය යුතුය. |
| (ඇ) අනෙකුත් නිලධාරීන්ගේ ආදර්ශ අත්සන් | - දෙපාර්තමේන්තු ප්‍රධානියා පෞද්ගලිකවම සහතික කොට නිල මුද්‍රාව තැබිය යුතුය. |

ආකෘති පත්‍ර අංක. **TOD /BA/02**

## <u>නිල බැංකු ගිණුම් මෙහෙයවන දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ</u>
## <u>වෙනස්වීම් සම්බන්ධව අනුමැතිය ලබාගැනීම සඳහා වන අයදුම් පත්‍රය</u>

| | |
|---|---|
| (1) | වැය ශීර්ෂය - |
| (2) | i. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව -<br>ii. උප කාර්යාලය – |
| (3) | දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය – |
| (4) | බැංකු ගිණුමේ නම – |
| (5) | බැංකුව හා ශාඛාව – |
| (6) | බැංකු ගිණුම් අංකය – |
| (7) | i. මේ දක්වා බැංකු ගිණුම මෙහෙයවන ලද ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා පිළිබඳ විස්තර<br>සම්පූර්ණ නම      තනතුර<br>...............................................      ..........................................<br>ii. නිලධාරියා ස්ථාන මාරු වූ/විශ්‍රාම ගිය දිනය – |
| (8) | i. වර්තමාන ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා පිළිබඳ විස්තර –<br>(මෙහි සඳහන් සියළුම විස්තර සැපයීම අත්‍යාවශ්‍ය බව කාරුණිකව සලකන්න)<br><u>සම්පූර්ණ නම</u>      <u>තනතුර</u>      <u>වාර්ෂික වැටුප</u>      <u>මු.රෙ.880 යටතේ ඇප තබා තිබේද යන වග</u><br>ii. වැඩ භාරගත් දිනය - |
| (9) | ලේකම්,<br>..................................<br>ඉහත සඳහන් විස්තර නිවැරදිය. මෙම බැංකු ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහා නව ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත බලය පැවරීමට අදාල ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කරමි. ඒවා ඔබගේ නිර්දේශය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන්නේ නම් මැනවි.<br>..........................................................<br>දිනය –      දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ප්‍රධාන මූල්‍ය නිලධාරී/<br>ප්‍රධාන ගණකාධිකාරී අත්සන (නිල මුද්‍රාව) |

| | |
|---|---|
| (10) | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්<br><br>නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.<br><br>දිනය- ..................................................<br>අමාත්‍යාංශයේ ලේකම්<br>(ප්‍රධාන ගණන් දීමේ නිලධාරී) ගේ අත්සන<br>(නිල මුද්‍රාව) |
| (11) | පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.<br><br>(i) නව දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ ආදර්ශ අත්සන, අමාත්‍යාංශ ලේකම් විසින් පෞද්ගලිකව සහතික කරන ලද අත්සන් කාඩ්පත් 02 ක් (අමාත්‍යාංශ ලේකම්ගේ නිල මුද්‍රාව සහිත)<br><br>(ii) නව අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන, ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී විසින් සහතික කරන ලද අත්සන් කාඩ්පත් 02 ක් (නිල මුද්‍රාව සහිත)<br><br>(iii) නව අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා අදාල තනතුරට පත්කරමින් නිකුත් කරන ලද පත්වීම් ලිපියේ සහතික කළ පිටපතක්. |

ආකෘති පත්‍ර අංක - **TOD /BA/03**

# නිල බැංකු ගිණුම් වැසීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ අයදුම් පත්‍රය

| | |
|---|---|
| (1) | වැය ශීර්ෂය - |
| (2) | i. අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව -<br>ii. උප කාර්යාලය - |
| (3) | දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය - |
| (4) | බැංකු ගිණුමේ නම - |
| (5) | බැංකු ගිණුම් අංකය - |
| (6) | බැංකුව හා ශාඛාව - |
| (7) | බැංකු ගිණුම වසා දැමීම සඳහා නිර්දේශ කිරීමට හේතුව - |
| (8) | අවසාන වරට බැංකු ගිණුම ක්‍රියාත්මක වූ වර්ෂය හා මාසය - |
| (9) | ගිණුමේ මුදල් නොවූ චෙක්පත් පිළිබඳව මු.රෙ.396 යටතේ ගෙන ඇති ක්‍රියා මාර්ගය - |
| (10) | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්,<br><br>ඉහත සඳහන් විස්තර නිවැරදිය. පහත සඳහන් ලියවිලි ද මේ සමඟ ඉදිරිපත් කරන අතර ඒ අනුව උක්ත නිල බැංකු ගිණුම වැසීමට පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.<br><br>..............................................................<br>දිනය - අමාත්‍යාංශයේ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන (නිල මුද්‍රාව) |
| (11) | වසා දැමීමට යෝජනා කරනු ලබන නිල බැංකු ගිණුමට අදාල පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.<br><br>(i) ගිණුම ක්‍රියාත්මක වූ අවසාන මාසයට අදාල බැංකු ප්‍රකාශයේ පිටපතක්<br>(ii) දැනට බැංකු ගිණුමේ පවතින ශේෂය පිළිබඳ බැංකුවෙන් ලබාගත් ශේෂ සහතිකයක්<br>(iii) අවසාන වරට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ පිටපතක් (මුදල් පොතේ සියළුම ගැලපීම් සිදුකල පසු) |

ආකෘති පත්‍ර අංක - **TOD /BA/04**

## <u>නිල බැංකු ගිණුම් නාමය වෙනස් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ අයදුම් පත්‍රය</u>

| | |
|---|---|
| (1) | වැය ශීර්ෂය - |
| (2) | i. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව -<br>ii. උප කාර්යාලය - |
| (3) | දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය – |
| (4) | නිල නාමය වෙනස් කිරීම සඳහා ඉල්ලුම් කරන නිල බැංකු ගිණුමේ,<br>i. නම –<br>ii. බැංකුව හා ශාඛාව –<br>iii. බැංකු ගිණුම් අංකය – |
| (5) | වෙනස් කිරීමට යෝජිත නිල බැංකු ගිණුම් නාමය – (අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තනතුර සහ බැංකු ගිණුමේ කාර්යය සංක්ෂිප්තව සංකේතවත් විය යුතුය. උදා:ලේකම්, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය- දේශීය ඖෂධ පැලෑටි සංවර්ධන ව්‍යාපෘතිය) |
| (6) | නිල බැංකු ගිණුම් නාමය වෙනස් කිරීමට බලපාන ලද හේතූන් – |
| (7) | ලේකම්,<br>.................................<br><br>ඉහත සඳහන් විස්තර නිවැරදිය. එබැවින් නිල බැංකු ගිණුමේ නාමය වෙනස් කිරීමට අදාල ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කරමි. ඒවා ඔබගේ නිර්දේශය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන්නේ නම් මැනවි.<br><br>දිනය – ........................................................<br>දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ප්‍රධාන මූල්‍ය නිලධාරී/<br>ප්‍රධාන ගණකාධිකාරී අත්සන (නිල මුද්‍රාව) |
| (8) | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්<br>නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.<br><br>දිනය - ........................................................<br>අමාත්‍යාංශයේ ලේකම්<br>(ප්‍රධාන ගණන් දීමේ නිලධාරී) ගේ අත්සන<br>(නිල මුද්‍රව) |
| (9) | පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.<br>(නිල බැංකු ගිණුම් නාමය වෙනස් කිරීමට අවශ්‍ය වූ නීතිමය හා අනෙකුත් තත්වයන් තහවුරු කිරීමට අදාල සියළුම ලියකියවිලි වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කල යුතුය.) |

ආකෘති පත්‍ර අංක - **TOD /BA/05**

## <u>නිල බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාව වෙනස් කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමේ අයදුම් පත්‍රය</u>

| | |
|---|---|
| (1) | වැය ශීර්ෂය - |
| (2) | i. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව - <br> ii. උප කාර්යාලය – |
| (3) | දෙපාර්තමේන්තුවක් නම් අදාල අමාත්‍යාංශය – |
| (4) | බැංකු ගිණුමේ නම – |
| (5) | බැංකු ගිණුම් අංකය – |
| (6) | දැනට පවත්වාගෙන යනු ලබන බැංකුව හා ශාඛාව – |
| (7) | වෙනස් කිරීමට යෝජනා කරනු ලබන බැංකු ශාඛාව – |
| (8) | බැංකු ශාඛාව වෙනස් කිරීමට නිර්දේශ කිරීම සඳහා පාදක වූ හේතූන් – (මෙසේ බැංකු ශාඛාව වෙනස් කල හැකිවන්නේ වලංගු හේතුවක් මත දැනට පවත්වාගෙන යනු ලබන බැංකු පද්ධතියේම වෙනත් ශාඛාවක් වෙත පමණි. උදා:- ගිණුම පවතින්නේ ලංකා බැංකුවේනම් එහි වෙනත් ශාඛාවකට පමණි) |
| (9) | ලේකම්, <br> ................................ <br><br> ඉහත සඳහන් විස්තර නිවැරදිය. අදාල ලියකියවිලි මේ සමඟ ඉදිරිපත් කරමි. ඒවා ඔබගේ නිර්දේශය සමඟ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන්නේ නම් මැනවි. <br><br> දිනය – <br><br> ........................................................ <br> දෙපාර්තමේන්තු ප්‍රධානියා/ ප්‍රධාන මූල්‍ය නිලධාරී/ <br> ප්‍රධාන ගණකාධිකාරී අත්සන (නිල මුද්‍රාව) |

| | |
|---|---|
| (10) | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්<br><br>නිර්දේශ කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.<br><br>දිනය - ........................................................<br>අමාත්‍යාංශයේ ලේකම්<br>(ප්‍රධාන ගණන් දීමේ නිලධාරී) ගේ අත්සන<br>(නිල මුද්‍රාව) |
| (11) | බැංකු ශාඛාව වෙනස් කිරීමට යෝජනා කරනු ලබන නිල බැංකු ගිණුමට අදාල පහත සඳහන් ලියවිලි මෙයට අමුණා ඇත.<br>i. අවසාන වරට ලබා ගත් මාසික බැංකු ප්‍රකාශයේ සහතික කල පිටපතක්<br>ii. අවසාන වරට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ සහතික කල පිටපතක්<br>iii. නිල බැංකු ගිණුම පවත්වාගෙන යනු ලබන බැංකු ශාඛාව වෙනස් කිරීම අත්‍යාවශ්‍ය බව තහවුරු කිරීමට අදාල සියළුම ලියකියවිලි වල සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කරන්න. |